රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 42/89

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1989 අගෝස්තු මස 10 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

## කාර්යාලයෙන් කලින් බැහැරව යාම.

1980.04.01 දිනැති අංක: 162 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතර වශයෙනි.

02. රටෙහි පවත්නා සාමාන්‍ය කලබල තත්වය හේතුකොට ගෙන තම ප්‍රධානීන්ට පවා නොදන්වා විවිධ වේලාවන්වල කාර්යාලයෙන් බැහැර යාම රජයේ නිලධාරීන් පුරුද්දක් කරගෙන ඇති බැව් රජයට දැන ගැනීමට ලැබී ඇත.

03. සියළුම නිලධාරියෙකු ඔහුගේ/ඇයගේ ප්‍රධානියා වෙතින් අනුමැතියක් නොලබා කාර්යාලයෙන් කලින් බැහැර නොවිය යුතු බවට රජය තීරණය කර ඇත. උදාහරණ වශයෙන්, ලිපිකරු නිලධාරියෙක් තමා සේවය කරන අංශයේ අංශ ප්‍රධාන/මාණ්ඩලික නිලධාරී වෙතින් අවසර නොලබා කාර්යාලයෙන් කලින් බැහැර නොවිය යුතුය. අංශ භාර මාණ්ඩලික නිලධාරියෙක් රාජ්‍ය ලේකම්/අතිරේක ලේකම් වෙතින් එවැනි අනුමැතියක් ලබා ගත යුතුය. රාජ්‍ය ලේකම්/අතිරේක ලේකම් විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගය පිළිබඳව ලේකම් වෙත හා ගරු ඇමතිතුමා/රාජ්‍ය ඇමතිවරුන් වෙත දන්වා සිටිය යුතුය.

04. පොදු ප්‍රවාහන සේවාවන් අයහපත් තත්වයක පවතින විට, එසේ නිලධාරීන් කලින් බැහැර යාම අනුමත කිරීමට බලය පැවරී ඇති නිලධාරීන් පොදු ප්‍රවාහන සේවා තත්වය පිළිබඳවත්, අදාළ නිලධාරියාට සිය නිවසේ සිට කාර්යාලයට ඒමට ඇති දුර ප්‍රමාණයත් තමා විසින්ම සොයා බලා සෑහීමකට පත්වීමෙන් පසුව අවශ්‍ය පරිදි තීරණය ගත යුතුය.

05. මෙම චක්‍රලේඛයේ අඩංගු උපදෙස් පිළිපදින ලෙසට ඔබගේ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ සියළුම නිලධාරීන් වෙත දැනුම් දිය යුතුය.

(සිරිල් ගමගේ)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.